ඉඩමට මායිම් උතුරු බස්නාහිරට: පිටඩි බණ්ඩාරට අයිති ඉඩම. උතුරු නැගෙනහිරට සහ දකුණු නැගෙනහිරට: පාරවල්, දකුණට සහ දකුණු බස්නාහිරට ලොට් "ඒ" දරණ කොටස සහ බස්නාහිරට, ලොට් 'බී' දරණ කොටස යන මෙකී මායිම් තුළ පිහිටි අ. 3, රූ. 3, පර්. 0 ක් විශාලවූ ඉඩමේ විත්තිකරුට අයිති ප්‍රමාණය වේ. මෙහි තුල ඇති ගෙය හැර අනිකුත් සියලුම දේත් වේ.

කේ. ඩී. පිටඩි,
නියෝජ්‍ය පිස්කල්, අවිස්සාවේල්ල.

වර්ෂ 1969 ජූලි මස 20 දින,
අවිස්සාවේල්ලේ පිස්කල් කන්තෝරුවේදී ය.

8-67

---

## දකුණු පළාත

### පිස්කල් විකිණීම

**මාතර දිස්ත්‍රික් නඩුශාලාවේදීය**

දෙනිපිටියේ වින්සන්ට් විජේරත්න වික්‍රමසිංහ ........................................................................ පැමිණිලිකාරයා.

නොම්මරය: ඇම්. ඇස්. 25 එදිරිව

දැනට බානගල පදිංචි, චාල්ස් වීරදිවාකර හෙවත් චාල්ස් වික්‍රම ඇරච්චි වීරදිවාකර ........................................ විත්තිකාරයා.

මෙහි පහත සඳහන්වෙන දේපලවලින් ඉහතකී නඩුවේ විත්තිකාරයාට තිබෙන අයිතිවාසිකම සහ ප්‍රයෝජනයත් රු. 1,446.87½ හා 67.9.15 දින සිට නීති පොළියද අයකර ගැනීම පිණිස වර්ෂ 1969 ක්වූ සැප්තැම්බර් මස 8 දින ප. ව. 1.30 ට මොරවක කඩපල අසලදී ප්‍රසිඬ වෙන්දේසියේ විකුණන්ට යෙදෙන බව මෙයින් දන්වනු ලැබේ.

1. මාතර දිස්ත්‍රික්කයේ මොරටක් කෝරලයේ බානගල පිහිටි අන්නාසිගලහේන නොහොත් පරන්විල වත්ත නැමති උතුරට, නැගෙනහිරට, දකුණට සහ බස්නාහිරට: රාජ සන්තක ඉඩම් මායිම් වූ අක්කර 49, රූඩ් 3, පර්චස් 22 ක් විශාල ඉඩමේ වවා තිබෙන තේ සහ රබර් වැවිල්ලද වේ.

මැ. ග. වින්සන්ට්,
මාතර අතිරේක නියෝජ්‍ය පිස්කල් වෙනුවට.

වර්ෂ 1969 ක්වූ ජූලි මස 24 වැනි දින,
මාතර, පිස්කල් කන්තෝරුවේ දීය,

8-246

---

## ඌව පළාත

### පිස්කල් විකිණීම

1. පරලෝසැපත් ආර්. ඇම්. අප්පුහාමි, ලියන්ගහවත්තෙගෙදර, නන්නාපුරාව,
2. එච්. ඇම්. බණ්ඩාරමැණිකා, (නීති මඟින් පත්කළ භාරකරු) ලියන්ගහවත්තෙගෙදර, නන්නාපුරාව........................පැමිණිලිකාරයා.

නොම්මරය: එම්. බී. 17,235 එදිරිව

ඩී. ඇම්. මුතුබණ්ඩා, ගමගෙදර, කුඹුගමුරේ, මැදගම්පත්තු කෝරළේ ........................................................ විත්තිකාරයා.

මෙහි පහත සඳහන්වෙන දේපලවලින් ඉහත කී නඩුවේ විත්තිකාරයාට තිබෙන අයිතිවාසිකම් සහ ප්‍රයෝජනයත් ඉඩම පිහිටි ස්ථානයේදී වර්ෂ 1969 ක්වූ අගෝස්තු මස 29 දින පෙරවරු 11 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්ට යෙදෙන බව මෙයින් දන්වනු ලැබේ. එනම් රු. 550ක් හා 4.10.68 සිට එම මුළු මුදල ගෙවන තුරු නීති පොළියත්, සෑම රු. 5 කට හා ඉන් කොටසකට .10 බැගින්වූ පවුන්ඩේජ් මුදලකුත් අයකර ගැනීම සඳහා:

ඌව පළාතේ බදුල්ල දිස්ත්‍රික්කයේ (දැනට මොණරාගල දිස්ත්‍රික්කයේ) මැදගම් පත්තු කෝරළේ වෙල්ලස්ස කොට්ඨාශයේ බිබිලේ මුල්ල ගම පිහිටි උතුරට: දලහගොල්ලේ කඩඉම් අස්වනාව, නැගෙනහිරට: මෙම කුඹුරේම පහත ඉම්නියර, දකුණට අඹගහ සහ පිටියද, බටහිරට: හෙලකුඹුරේ ඉම්නියරද විශයෙන් මායිම්වූ වී අමුණු දෙකක පමණ වපසරිය ඇති උන්නිනි අම්මාගේ පහත කුඹුර නැමැති කුඹුරෙන් නොබෙදූ 1/3 කොටස. මෙය අංක. එෆ් 41/270 වශයෙන් ලියාපදිංචිකර ඇත.

ඒ. පී. සිවලිංගම්,
ඌව පළාතේ පිස්කල් වෙනුවට.

1969 ජූලි මස 22 දින,
බදුල්ලේ පිස්කල් කාර්යාලයේදීය.

8-227

